නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

ලංසු කැඳවීම

8 වෙනි මහල වැඩිදියුණු කිරීම

1. ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන් දින 60ක කොන්ත්‍රාත් කාල පරිච්ඡේදයකට යටත්ව 8 වන මහලේ නව්‍යකරණ කටයුතු උදෙසා සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2. ජාතික මට්ටමින් තරඟකාරී ලංසු ක්‍රමවේදයක් ඔස්සේ ලංසු පත් මෙහෙයවනු ලැබේ.

3. කොන්ත්‍රාත් පිරිනැමීමට සුදුසුකම් ලෙස ලංසු පිරිනමන දින වන විට සුදුසුකම් ලත් ලංසුකරුවන් අපලේඛනගත නොවී තිබිය යුතු අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ C7 ශ්‍රේණියේ හෝ ඊට ඉහළ මට්ටමේ ශ්‍රේණියක ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී තිබිය යුතුය.

4. අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීමට සුදුසුකම් ලත් ලංසුකරුවන් පහත සඳහන් නිර්ණායක සපුරා තිබිය යුතුය.

- පසුගිය වසර පහ තුළ සම්පූර්ණ කරන ලද ඉදිකිරීම්වල පිරිවැටුම: සෑම අවුරුද්දකම අවම වශයෙන් රුපියල් මිලියන 3ක් වන පරිදි රුපියල් මිලියන 30ක් වීම.
- ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් පළපුරුද්ද සහ අවසන් වසර පහ තුළ රුපියල් මිලියන 7කට නොඅඩු මෙහි කාර්යයට සමාන කාර්යයක් අවසන් කර තිබීම.
- ද්‍රවශීල වත්කම් හෝ ණය අයිරා පහසුකම් ලෙස රුපියල් මිලියන 1ක වටිනාකමක් තිබීම.

5. මේ සඳහා කැමැත්තක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු අධ්‍යක්ෂ (පාලන), තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, නො. 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයෙන් 2017.09.25 දින සිට 2017.10.09 දින තෙක් පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා ලබාගත හැකිය.

දුරකථන අංක - 011-2555029 ෆැක්ස් - 011-2555029

6. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රිසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ආපසු නොගෙවන රුපියල් 2000.00ක ගාස්තුවක් හා ලිඛිත අයදුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, නො. 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයට ඉදිරිපත් කිරීමෙන් 2017 සැප්තැම්බර් මස 25 වන දින සිට 2017 ඔක්තොම්බර් මස 09 දින දක්වා පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ ලබාගත හැකිය.

7. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත් වෙන් වෙන්ව කවරවල බහා මුද්‍රා තබා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, නො. 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයට 2017 ඔක්තොම්බර් මස 12 දින පස්වරු 2.00ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත පරිදි ලැබුණු ලංසු පත් කඩිනමින් ලංසු තබන්නන් නියෝජනය කරමින් පැමිණි නියෝජිතයින් ඉදිරියේ එවලේම විවෘත කරනු ලැබේ.

8. ලංසු කැඳවනු ලබන අවසාන දින හෝ වෙනත් දීර්ඝ කරන ලද කාල පරිච්ඡේදයක සිට දින 120ක කාලයක් සඳහා ලංසු වලංගු වේ.

9. සියලුම ලංසු ලේඛන ලංසුවක් සඳහා වන ආරක්ෂක විධි විධාන අනුගමනය කරමින් මහ බැංකුවේ අනුමත ඕනෑම වාණිජ බැංකුවක රුපියල් 90,000.00ක් වටිනා 2018.03.16 වන දින තෙක් වලංගු ආපසු ගෙවන බැඳුම්කරයක් අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව නමින් තැන්පත් කිරීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සරප් වෙත රුපියල් 45,000ක් ගෙවිය යුතුය.

10. ලංසු කැඳවීම සඳහා වූ පූර්ව රැස්වීමක් 2017 ඔක්තොම්බර් මස 04 දින පෙරවරු 10.00ට නිපුණතා පියසේ 3 වන මහලෙහි පිහිටි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ රැස්වීම් ශාලාවෙහි පැවැත්වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
නො. 354/2,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.